# විරාම ලකුණු හඳුනා ගනිමු

- 3 ශ්‍රේණියට අදාළ විරාම ලකුණු පහත පරිදි වේ.
    1. නැවතීමේ තිත
    2. ප්‍රශ්නාර්ථ ලකුණ
    3. කොමාව
    4. යුගල උඩු කොමා

## 01. නැවතීමේ තිත ( . )

වාක්‍යයන් අවසානයේදී නැවතීමේ තිත තබයි. එමඟින් වාක්‍ය අවසාන බව ප්‍රකාශ වේ.

උදා -

- කවිඳු යහළුවන් සමගින් සෙල්ලම් කරමින් සිටියා.
- අපි හැමෝම ආසාවෙන් ගීතය රසවින්ද.

*අභ්‍යාස -*

✓ ඡේදය පිටපත් කරගෙන, කියවා සුදුසු තැන්වලට නැවතීමේ තිත තබන්න.

| |
|---|
| මම කෝෂය ඇතුළේ සති දෙකක් විතර හිටියා ඒ අතරේ මගේ ඇග ටිකෙන් ටික වෙනස් වුණා දවසක් මම කෝෂයෙන් එළියට ආවා මම අලුත් වෙලා මගේ මුළු ඇගම වෙනස් වෙලා මට හිතාගන්න බෑ පාට පාට අත්තටු දෙකක් ඇවිල්ලා හරි පුදුමයි |

## 02. ප්‍රශ්නාර්ථ ලකුණ ( ? )

යම්කිසි දී ඇති වාක්‍යයකින් අසන්නේ ප්‍රශ්නයක් නම් එම වාක්‍යවල අගට ප්‍රශ්නාර්ථ ලකුණ යොදයි.

උදා -

- ඔබේ ගම කුමක්ද?
- දැක්කේ නැද්ද ඒ සතාව?

*අභ්‍යාස -*

✓ පහත ඡේදය පිටපත් කරගෙන, කියවා නිවැරදිව ප්‍රශ්නාර්ථ ලකුණු යොදන්න.

| |
|---|
| අපි පොල් ගහ හදන සෙල්ලම කරමුද හා ඒක හොඳයි. සීයේ සීයේ පොල් ගෙඩියක් කඩා ගන්නද සීයේ සීයේ පොල් ලෙලි ගහන්නද සීයේ සීයේ පොල් බිඳින්නද සීයේ සීයේ පොල් වතුර බොන්නද |

## 03. කොමාව ( , )

වාක්‍යයන් අවසන් වීමට කලින් යම් වාක්‍යයක් සඳහා කොමාව යොදයි. එක් එක් වචන වෙන් වෙන් ලෙස පැහැදිලි කරගැනීම කොමාව යෙදීම තුළින් සිදු වේ.

උදා -

- පොත් කියවීමෙන් අපට දැනුම, සතුට, විනෝදය ලබාගත හැක.
- තෙල්, මල්, හඳුන්කූරු ගෙන අපි පන්සල් ගියා.

*අභ්‍යාස -*

✓ පහත ඡේදය කියවා නිවැරදිව කොමාව යොදන්න.

සත්තු වත්තේ අප නැරඹිය යුතු ස්ථාන ගුරුතුමිය පැහැදිලි කළා. ඒ අනුව මින් මැදුර කුරුලු උයන සමනල උයන යනාදී ස්ථාන නැරඹූ අප සිංහයා වලහා කොටියා අශ්වයා ජිරාෆ් වැනි සතුන් ද කුරුල්ලන් ද උරගයන් ද නැරඹුවා.

## 04. යුගල උඩු කොමාව ( " " )

යම් කෙනෙක් විසින් කරන ලද ප්‍රකාශයක්, යම් කිසි පොතකින් හෝ යම් දෙයකින් බලාගෙන එය උපුටා ලිවීමේදී එම කොටස පැහැදිලි  වීමට යුගල උඩු කොමා යොදයි.

උදා -

- "මුහුද හරිම ලස්සනයි" රවිඳු කිව්වා.
- "අහසයි මුහුදයි එකට ගෑවෙනව ද?"

*අභ්‍යාස -*

✓ නැවතීමේ තිත, ප්‍රශ්නාර්ථ ලකුණ, කොමාව, යුගල උඩු කොමා යන විරාම ලකුණු නිවැරදිව යොදා පහත ඡේද කොටස් නැවත ලියන්න.

01. අනේ ඇත්තද අපි හෙට ඒ සෙල්ලම කරමු පවනි එහෙම කියද්දි ගුරුතුමා පන්තියට ආවා ආයුබෝවන් ළමයි මොනවා ගැනද මේ කතාව ගුරුතුමා ඇහුවා ආයුබෝවන් සර් අපි අද පොල් කැඩුවා කවීශා කිව්වා

02. පුතා යාළුවොත් එක්ක මෙහෙට එන්න කවිඳුගෙ අම්මා කතා කළා කවිඳු යාළුවොත් එක්ක ගේ ඇතුළට ආවා රූපවාහිනියේ ලොකු උත්සවයක් පෙන්වනවා කවිඳු කිව්වා හමුද පෙලපාළි යුද්ධ ටැංකි අහසේ කරනම් ගසන ගුවන් යානා පැරෂූට් බටයෝ ආදි බොහෝ දේ රූපවාහිනිය මත දිග හැරුණා

03. සුදුසු විරාම ලකුණු යොදා වාක්‍ය නැවත ලියන්න.

I. හැමෝ ම තාලයට අත්පුඩි ගැසුවා

---

II. ආයුබෝවන් සභාවෙන් අවසරයි

---

III. හැමෝම සූදනම් වෙලා නේද ආවේ

---

IV. මේ කරත්තේ ඔයාගෙද

---

V. නෑ ඒක වලස් හාමිගේ කරත්තේ

---

VI. මට මොකද වුණේ

---

VII. කවි පොත් කතන්දර පොත් තේරිවිලි පොත් යනාදී ලෙස මාගේ පොත් රාක්කය පිරුණා

---

---

විමසීම් :
සකුන්තලා ගුරුතුමිය - 076 879 3444